**නාවලපිටිය නගර සභාව - 2020**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

නාවලපිටිය නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.358,782 ක් වටිනා මිශ්‍ර තැන්පතු ශේෂ 07 ක් සහ රු.579,000 ක් වටිනා ටෙන්ඩර් තැන්පතු 03 ක් මූල්‍ය ප්‍රකාශනවල පොදු තැන්පත් ශේෂය යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | අතපසුවීමකින් විෂය නිලධාරී හට ගිණුම්ගත කිරීමට නොහැකිවී ඇත. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.801,209 ක් වටිනා විවිධ ණයහිමි ශේෂයන් 13 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් අතර ගැලපීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබූ රු.4,388,184 ක් වූ වත්කම් 09 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඈ) | සභාවට විරුද්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව 05 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | ඒ අනුව ඉදිරියේදී කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඉ) | වැටුප් ප්‍රතිපූර්ණය සඳහා ලැබූ තිබූ රු.68,042,103 ක් වූ ආදායම ඒ ඒ වැඩසටහන යටතේ වෙන වෙනම ගිණුම්ගත කළ යුතු වුවද පොදු පරිපාලන වැඩසටහන යටතේ පමණක් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී එක් එක් වැඩ සටහන යටතේ ගිණුම් ගත කිරීමට සැලැසුම් කර ඇත. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.17,291,938 ක් වූ ණය ගැති ශේෂය තුළ ඇතුළත් වාහන කුලී වටිනාකම උපලේඛන අනුව රු.3,487,332 ක් වුවද එය රු.3,497,732 ක් ලෙස ගිණුම්වල දක්වා තිබීමෙන් රු.10,400 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ රු.1,899,358 ක් වූ තොග අයිතම 05 කට අදාළ ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය උපලේඛන ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරියේදී ඉදිරිපත් කරමි. | විගණනයට අවශ්‍ය සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත | අවස්ථා 9 කදී අයකරන ලද රු.11,525 ක් වටිනා මුද්දර බදු දේශීය අදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරමි. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| | (I) 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛය | | | |
| | (i) 3 ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව සභාව සතු වෙළඳ සංකීර්ණ 04 ක කඩ කාමර කුළී තක්සේරු කිරීමට කටයුතු කර | නව තක්සේරුව ලබා දෙන ලෙසට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දිගින් දිගටම දන්වා | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | ඇතත් තක්සේරුව මෙතෙක් ලබා දී නොමැත. | |
| (i) 51 ඡේදය | කඩ කාමර 03 කින් අයවිය යුතු රු.1,338,181 ක එක්වන් මුදල් අයකර ගැනීමට චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අංක 50 දරන කඩ කාමරයේ හිඟයෙන් කොටසක් මේ වන විට අයවී ඇති බවත් පවතින කොවිඩ් වසංගත තත්වය මත ඉතිරි හිඟ මුදල් ගෙවීම සඳහා කල් ඉල්ලා ඇති අතර ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,536,501 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,259,441 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
------------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු | | |
| | සමාලෝචිත වර්ෂයට අදාළව රු.17,906,692 ක වරිපනම් හිඟයක් පැවතුණි. ඒ තුළ පැවති රු.906,697 ක් වූ රජයේ ආයතන මඟින් ලැබිය යුතු වරිපනම් හිඟයක් ද වූ අතර, එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ඉදිරි පියවර ගැනීමට සැලැසුම් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කඩ කුලී | | |
| | සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.3,130,748 ක් වූ හිඟහිටි කඩ කුලී ශේෂයෙන් වර්ෂය තුළදී රු.71,240 ක් හෙවත් සමස්ත හිඟයෙන් සියයට 02 ක් පමණක් අයකරගෙන තිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර කටයුතු කිරීමට සැලැසුම් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

(ඇ) වෙනත් ආදායම්

-------------------

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.875,892 ක් වූ ජල ගාස්තු හිඟයෙන් වර්ෂය තුළ රු.132,842 ක් හෙවත් සියයට 15 ක පමණක් අයකරගෙන තිබුණු අතර වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.885,275 ක් විය. | රු.37,921 ක් අයකර ගත හැකි වූ බවත් අයකර ගත නොහැකි මුදල් සඳහා විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය මත කපා හැරීමට සැලැසුම් කර ඇති බවත් දැනට ක්‍රියාත්මක ජල සේවා සඳහා හිඟ මුදල් නොගෙවන්නේ නම් විසන්ධි කිරීමට කටයුතු යොදා ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ බදු ඉඩම් ආදායම රු.605,170 ක් වූ අතර, ඒ තුළ වර්ෂ 1 ත් 3 ත් අතර හිඟය රු.185,239 ක් ද වර්ෂ 03 ට වැඩි හිඟය රු.232,455 ක් ද විය. | ඉදිරියේදී ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර කටයුතු කිරීමට සැලැසුම් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | රථ වාහන හිඟ හිටි ශේෂය ලෙස වර්ෂය ආරම්භයේදී පැවති රු.2,568,399 න් සමාලෝචිත වර්ෂය තුළදී රු.375,617 ක් හෙවත් ආරම්භක හිඟයෙන් සියයට 15 ක් පමණක් අයකරගෙන තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟය රු.1,508,020 ක් විය. | ඉදිරියේදී ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර කටයුතු කිරීමට සැලැසුම් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | සුපිරි වෙළඳ සංකීර්ණයෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු රු.35,038,854 ක් වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළදී රැස්කරගෙන තිබූ ආදායම රු.43,784 ක් හෙවත් සියයට 0.12 ක පමණක් වූ අතර වර්ෂය අවසානයට පැවති කඩ කුලී හිඟය රු.54,409,970 ක් විය. | නව කඩ කුලිය සංශෝධනය අනුව නඩු කටයුත්තක් විභාග වන බැවින් එම නඩුව අවසන් වන තෙක් කඩ කුලිය හා හිඟ මුදල් අය කිරීමේ ගැටළුවක් පවතී. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------------**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට නඩු ගාස්තු ලෙස ගෙවා තිබූ රු.1,872,000 ක මුදලින් රු.1,847,700 ක් විත්තිකරු ලෙස පෙනී සිටීම වෙනුවෙන් දරා තිබුණි. | පවරා ඇති නඩු සම්බන්ධයෙන් නීතිඥ සහය ලබා ගැනීම අත්‍යාවශ්‍ය විය. එබැවින් මෙම නඩු ගාස්තුව දැරීමට සිදුවී ඇත. | අධිකරණමය කටයුතුවලට මැදිහත් නොවන ආකාරයෙන් නීති, රීතිවලට අනුකූල ලෙස කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.17,291,938 ක් වූවෙනත් ආදායම් ණයගැති ශේෂය තුළ වසර 02ත්10 ත් දක්වා කාලයට අදාළ රු.7,256,995 ක් ඇතුළත්ව තිබුණි. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය මත ආදායම් අය කිරීමට කටයුතු කිරීමට නොහැකි විය. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතු වීම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.5,578,120 ක් වූ අතර ඒ තුළ වර්ෂ 03 කට වඩා පැරණි ණයහිමි ශේෂය රු.3,097,537 ක් විය. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,366,247 ක ගෙවීම් නිමකර රු. 1,073,458 ක මුදලක් ගෙවීමට ඇති බව. අවසන් කොටස් මුදල් ලෙස රු.2,232,523 ක ගෙවීම් සිදුකර ඇත. | නොපමාව පියවීමට කටයුතු කළයුතු වීම. |